᳴ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1914/6 - 2015 මැයි මස 11 වැනි සඳුදා - 2015.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තිය හා 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්ති යටතේ පනවනු ලබන නියෝග හා රෙගුලාසි

1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය හා 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්ති බලතල ප්‍රකාර පනවනු ලබන නියෝග හා රෙගුලාසි මෙමගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය,
මුදල්, ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන,
ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය,
සංචාරක හා ඉංජිනේරු සේවා අමාත්‍ය,
දකුණු පළාත - ගාල්ල.

**නියෝග**

01. මෙම නියෝග 2015 අංක 01 දරන "මගී සේවා අවසර පත්‍ර හා අනෙකුත් ගාස්තු අයකිරීම් පිළිබඳ නියෝග" වශයෙන් නම් කරනු ලැබේ.

02. මෙම නියෝග දකුණු පළාත් සභාවේ 2009 අංක 01 දරන "මගී සේවා අවසරපත්‍ර හා අනෙකුත් ගාස්තු අයකිරීම් පිළිබඳ "නියෝග යටතේ " අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව " ඇතුළත් උපලේඛන අංක 4 හි කාරණය හා ගෙවිය යුතු ගාස්තුව පිළිබඳ සංශෝධනය කිරීමක් වේ.

1A - PG 2459 — 406 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛන 04*

*අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව*

මෙම උපලේඛනයේ I තීරුවේ දක්වා ඇති කිසියම් විෂයයක යම් කාර්යයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය විය යුතුය.

| *I තීරුව* <br> *කාරණය* | *II තීරුව* <br> *ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය* <br> *රු. ශ.* |
|---|---|
| 1. අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 200.00 |
| 2. මගී සේවා අවසර පත්‍රයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 3,000.00 |
| 3. මගී සේවා අවසර පත්‍රයක් නියමිත දිනට දීර්ඝ නොකිරීම නිසා අධිභාරය මසකට හෝ ඉන් කොටසකට | 250.00 |
| ඉන් වැඩිවන සෑම මසක් සඳහාම | 1,000.00 |
| 4. අතුරු මාර්ග සටහනක් සඳහා (වර්ෂයකට හෝ ඉන් කොටසකට) | 1,000.00 |
| 5. මගී සේවා අවසරපත්‍ර පොත (අනුපිටපතක් නිකුත් කිරීම) | 1,000.00 |
| 6. මගී සේවා අවසරපත්‍ර ලේබලය (අනුපිටපත) | 500.00 |
| 7. විශේෂ චාරිකා බලපත්‍ර පළමු දිනට | 300.00 |
| වැඩිවන සෑම දිනකටම | 100.00 |
| 8. තාවකාලික බලපත්‍ර (දිනකට) ගාස්තුව | 100.00 |
| 9. බලපත්‍රයක් නොමැති පුද්ගලයෙකුට බලපත්‍රයක් නිරවුල් කරදීම | |
| ආසන ධාරිතාව 42 හෝ ඊට වැඩි | 100,000.00 |
| ආසන ධාරිතාව 30 හෝ 41 දක්වා | 75,000.00 |
| ආසන ධාරිතාව 30 ට අඩු | 50,000.00 |
| 10. බලපත්‍රයක් හිමි ධාවකයකුට බලපත්‍රයක් නිරවුල් කිරීමට | |
| ආසන ධාරිතාව 42 හෝ ඊට වැඩි | 75,000.00 |
| ආසන ධාරිතාව 30 හෝ 41 දක්වා | 56,250.00 |
| ආසන ධාරිතාව 30 ට අඩු | 37,500.00 |
| 11. බලපත්‍ර හිමියා මියගිය විට නීත්‍යානුකූල අයිතිය හිමි වන පුද්ගලයාට බලපත්‍රය පැවරීම (භාර්යාවට/ස්වාමියාට හෝ දරුවන්ට) | 5,000.00 |
| 12. බස්රථයක කාලසටහනක අනු පිටපතක් නිකුත් කිරීම | 100.00 |
| 13. පොදු ඉල්ලීම මත කාලසටහන් සංශෝධනයට | 250.00 |
| 14. අතිරේක ගාස්තු සටහන් නිකුත් කිරීමට | 100.00 |
| 15. ධාවකයින්ගේ පොදු ඉල්ලීම මත කාර්ය චක්‍ර සංශෝධනයට | අය නොකෙරේ |
| 16. බස්රථය මාරු කිරීම සඳහා | 2,000.00 |
| 17. සේවාව සංශෝධනය කිරීම සඳහා | |
| ග්‍රාමීය පෙදෙසකට සංශෝධනය කිරීමට | 2,000.00 |
| A හා B මාර්ග ඔස්සේ සංශෝධනය කිරීමට | 100,000.00 |
| 18. සේවා ගාස්තු පළාත් | 750.00 |
| 19. සේවා ගාස්තු හා පිවිසුම් ගාස්තු අන්තර් පළාත් | 1,000.00 |
| 20. සේවා ගාස්තු හා පිවිසුම් ගාස්තු අධිවේගී මාර්ගයේ | 1,500.00 |
| 21. සේවා ගාස්තු/පිවිසුම් ගාස්තු ගෙවීම ප්‍රමාද වීම (මසකට හෝ ඉන් කොටසකට) 10% අධිභාරයක් පනවනු ලැබේ. | |
| 22. කාලසටහන් හෝ වෙනත් පරිඝණක සටහන් ලබා ගැනීම මුද්‍රිත එක් කොළයකට | 50.00 |
| 23. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ධාවකයින් වෙත නිසිසැරිය ව්‍යාපෘතිය යටතේ ප්‍රේෂණය කරනු ලබන ගාස්තු මත අයකරනු ලබන පරිපාලන වියදම | 10% |

මෙම නියෝග 2015 ජූනි මස 01 වැනි දින සිට බලපැවැත්වේ.

05 - 658

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.